# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2022 අංක 24 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2022 සැප්තැම්බර් මස 16 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 15.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 24 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 19/2017

**(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2022 අංක 24 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 46 වන වගන්තියේ (1), (2) සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 131 වන අධිකාරයේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1) යම් බලයලත් නිලධරයකු, බේරුම්කරුවකු, කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ කොමසාරිස්වරයා විසින් හෝ ඉදිරිපිට දී ගනු ලබන, මේ පනත යටතේ වූ යම් නීති කෘත්‍යයක පාර්ශ්වයක් විසින් නීතිඥවරයකු මඟින් හෝ නියෝජිතයකු මඟින් ක්‍රියාකරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, යම් පාර්ශ්වකරුවකුගේ නියෝජිතයකු—

(අ) එම පාර්ශ්වය වෘත්තීය සමිතියක් වන අවස්ථාවක හෝ වෘත්තීය සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන අවස්ථාවක, එම වෘත්තීය සමිතිය හෝ එක් එක් වෘත්තීය සමිතිය නියෝජනය කිරීම සඳහා වූ තැනැත්තකු විය යුතු ය;

(ආ) එම පාර්ශ්වය අර්ධ වශයෙන් යම් වෘත්තීය සමිතියකින් හෝ සමිතිවලින් ද, අර්ධයක් ඒ සමිතියක සාමාජිකයන් නොවන සේවායෝජකයන්ගෙන් හෝ සේවකයන්ගෙන් ද, සමන්විත වන අවස්ථාවක දී, ඒ සමිතිය නියෝජනය

කිරීම සඳහා වූ තැනැත්තකු නැතහොත් ඒ එක් එක් සමිතිය නියෝජනය කිරීම සඳහා වූ තැනැත්තකු සහ එකී සේවායෝජකයන් හෝ සේවකයන් විසින් නම් කරනු ලබන, නියෝග මඟින් නියම කරනු ලබන තැනැත්තන් නියමිත සංඛ්‍යාවක් වන්නේ ය; සහ

(ඇ) එම පාර්ශ්වය සේවායෝජකයන් හෝ සේවකයන්ගෙන් සමන්විත වන අවස්ථාවක, එම පාර්ශ්වය එම සේවායෝජකයන් හෝ සේවකයන් විසින් නම් කරනු ලබන තැනැත්තන් නියමිත සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.